සීතාවකපුර නගර සභාව

කොළඹ දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 28 දන ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 24 දනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ජනවාරි 29 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව සීතාවකපර නගර සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට සීතාවකපුර නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදවෙන් අවසන් වර්ෂයසඳහා එහ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිපල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ගිණුම් වලින් අත්හැරීම්**

සමාලෝචිත වර්ෂය තුල දී මිලදී ගෙන තිබූ වටිනාකම රු.52,500 ක් වූ ස්ථාවර වත්කම් සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය විසින් ලබා දී තිබූ සංඥා නාද උපකරණ කට්ටල 06 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

**(ආ) වර්ගීකරන දෝෂ**

සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු. 6,525,926 ක අතැති තොගය පොදු ගබඩා, විදුලිය ගබඩා හා ආයුර්වේද තොග ලෙස වෙන් වෙන් ව දක්වා නොතිබුනි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

වටිනාකම රුපියල් 1,110,351 ක් වූ පෙර ගෙවුම් ශේෂ හා රුපියල් 6,525,926 ක් වූ පොදු ගබඩා ගිණුම් ශේෂ සකස් වූ ආකාරය දැක්වෙන උපලේඛණ විගණනය සඳහා ඉදිරිපත් නොවීම නිසා එම ශේෂ සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 16,750,454ක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම රු. 16,428,291 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිග ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිග ආදායම් තොරතුරු පහත දැක්වේ.

| වියදම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිගය |
|---|---|---|---|
| | රු. 000‘ | රු. 000‘ | රු. 000‘ |
| (i) වරිපනම් හා බදු | 12,922 | 12,575 | 5,079 |
| (ii) බදු කුලී | 25,773 | 18,376 | 14,556 |
| (iii) බලපත්‍ර ගාස්තු | 933 | 645 | 108 |
| (iv) වෙනත් ආදායම් | 11,600 | 11,240 | 8,105 |

### 2.2.2 වෙළඳ/ පරිසර බලපත්‍ර නිකුත් කිරීම

(අ) වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමේදී ආදායම් එකතු කර ගැනීම කෙරෙහි පමණක් සැලකිලිමත් නොවී මහජන යහපත පිණිස ව්‍යාපාර පරීක්ෂා කර බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව ද සැලකිලිමත් වී නොතිබුණි.

(ආ) පරිසර බලපත්‍ර ලබා ගතයුතු ව්‍යාපාර පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂාවක් මගින් හදුනා ගැනීමක් කර නොතිබීම නිසා, මහජන යහපතට හානී ගෙන දෙන ව්‍යාපාර පවත්වා ගෙන යැමට අවස්ථාව සැලසී තිබුණි.

**2.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**සෘජු කර්මාන්ත සඳහා ද්‍රව්‍ය නිකුත් කිරීම.**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෙර මිශ්‍රණ සඳහා යොදා ගන්නා තාර, චිප්ස් ගල් හා වැලි තොග ලැබීම්, නිකුත් කිරීම් ද පෙර මිශ්‍රණ නිශ්පාදන නිකුත් කිරීම් හා ඉතිරි තොග වෙන් වෙන් ව දැක්වෙන පරිදි ලේඛනය ක් පවත්වා නොතිබුණි.

(ආ) 2011 ජනවාරි 01 දින සිට ඔක්තෝබර් 19 දින දක්වා පහත සඳහන් කර්මාන්ත ඇතුළු නඩත්තු කටයුතු සිදුකල රු.2,490,080 ක් වූ කර්මාන්ත 39 ක් ආරම්භ කිරීමේදි අවශ්‍ය කරන පෙර මිශ්‍රණ හා අනිකුත් ගල් වර්ග ප්‍රමාණයන් ඇස්තමේන්තු කර නොතිබුණි. නඩත්තු කටයුතු අවසන් කළ මාර්ගයන්හි වැඩ ආරම්භ කල හා අවසන් කල දුර ප්‍රමාණය, යොදාගත් පෙර මිශ්‍රණ ප්‍රමාණය හා යොදා ගත් අනිකුත් ගල් වර්ග ප්‍රමාණයන් ඇතුලත් කර සාර්ථකව කටයුතු නිම කළ බවට කාර්මික නිළධාරියෙකුගේ වාර්තාවක් නොවිය.

**2.4 අවිධිමත් ගනුදෙනු**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තිය ප්‍රකාරව භාණ්ඩයක් හෝ සේවයක් මිලදී ගැනීමේදී ඇස්තමේන්තුගත වියදමින් 20% කට වැඩි මුදලක් අත්තිකාරම් ලෙස ලබා දිය නොහැකි වුවද, සභාවේ වාහන 02 ක් අලුත්වැඩියා කිරිම සඳහා ඇස්තමේන්තුගත මුදලින් 52% ක් හා 61% ක අත්තිකාරම් මුදල් ගෙවා තිබුණි.

**2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත කරුනු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂ වල එකතුව රු. 113,438,929 ක් වූ අතර, එම ශේෂය තුල වසර 05 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු. 10,267,133 ක ශේෂයන් ද විය.

(ආ) අයවැයගත හා තථ්‍ය ආදායම් සහ වියදම් අතර සැළකිය යුතු අවාසි සහගත විචලනයන් නිරික්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබු බව නිරික්ෂණය විය.

2.6. කාර්ය සාධනය

පහත කරුනු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) ජංගම ආයුර්වේද සායන 12 ක් වර්ෂය තුල පැවැත්වීමට සැලසුම් කර තිබු නමුත්, 2011 වර්ෂයේ දි එක් සායනයක් පමණක් පවත්වා තිබුණි.

**(ආ)** ආයුර්වේදය පිළිබඳව දැනුවත් කිරිම, පාසැල් අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම, ඔසු උයන් නවීකරණ කටයුතු, කොළ කැද සහ ඔසු පැන් විකිණීම සඳහා අළෙවි කුටි ඉදි කිරිම යන කාර්යයන් ඉටු කිරීමට සැලසුම් කර තිබු නමුත්, එම කටයුතු සමාලෝචිත වර්ෂය තුළ සිදු කර නොතිබුණි.

**2.7 වත්කම් කළමනාකරණය**

**(අ) අයවීමට ඇති සේවක ණය**

2011 දෙසැම්බර් 31 දිනට අය විය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂ වල එකතුව රු.5,301,455 ක් වූ අතර, එම ශේෂය තුල හිග හිටි රු.165,001 ක ණය ශේෂයක් ද විය.

**(ආ) ලැබිය යුතු ගිණුම්**

2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂ වල එකතුව රු. 35,033,172 ක් වූ අතර, එම ශේෂය තුල වසර 05 සිට 12 දක්වා දීර්ඝ කාලයක් තුල ඉදිරියට ගෙන එමින් පවතින රු. 15,367,883 ක ශේෂයන් ද විය. ඒවා අය කර ගැනීමට/ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) තොග පාලනය